# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,386 - 2024 මැයි මස 22 වැනි සිකුරාදා - 2024.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 148 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 152 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජුනි 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි 31 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

267 - B 82557 — 5,403 (2024/04)

# පළාත් පාලන නිවේදන

## පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

### පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත, වරිපනම් බදු ප්‍රතිශතය නිවේදනය කිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරන ලේකම් වන එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත 4%ක වරිපනම් බද්දක් අය කිරීමට උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

### විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත 4% ක වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරන පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.

05-284

---

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (අ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය අනුව බස්නාහිර පළාත් සභාවේ කලුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් මාර්ගය පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.


මෙම අංක 09 -240 නිවේදනය හා 2023.09.15 දිනැති අංක 2350 *ගැසට් පත්‍රයේ* පළ වී ඇති අතර විරෝධතා ඉදිරිපත් කිරීමට පනවා තිබූ කාල සීමාව තුළ මෙම මාර්ගය සම්බන්ධයෙන් කිසිදු විරෝධත්වයක් ඉදිරිපත් වී නොමැති හෙයින් මෙම උපලේඛනයේ සඳහන් මංමාවත පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවට මාර්ග සිතියම සහිතව *ගැසට් පත්‍රයේ* පළ කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

### උපලේඛනය

| *අනු. අංකය* | *පාරේ නම* | *ග්‍රාම සේවා වසම* | *ආරම්භය* | *අවසානය* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|
| 1 | වෙරළුගහත්ත මාර්ගය | 836 පැළෑද | පැළෑද ප්‍රධාන මාර්ගයේ සිට මිල්ලග හවත්ත පිටකට්ටිය සහ මහගලදෙණිය පිටකට්ටියේ ගොඩැල්ල සිට | පොල්ගස්ගොඩැල්ල ඉඩමේ ආරම්භය දක්වා | මීටර් 140 | මීටර් 04 |

ජී.සමන්ති පෙරේරා,
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල හා
කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි1,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2024 මැයි මස 13 වැනි දින.


පිඹුරු අංකය 1330
257A
257B
258A
259A
255A
225A
225B
225C
225D
225E
254A
පරිමාණය 1 : 1000
බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ,
පිඹුර
මායිම්
උතුරට - ඇ.ඹ.පි.132 හි 255 සහ 254 කැබැලි
නැගෙනහිරට - ඇ.ඹ.පි.132 හි 254 සහ 225 කැබැලි
දකුණට - ඇ.ඹ.පි.132 හි 225 කැබැල්ල සහ මාර්ගය
බස්නාහිරට - ඇ.ඹ.පි.132 හි 225 කැබැල්ල සහ පැත්තෙ ඇළ
2017-06-20

## පානදුර ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පහත දක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "**ජයතිලක පාර**" ලෙස නම් කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. එන්. එස්. ප්‍රනාන්දු,
පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා පානදුර ප්‍රාදේශීය සභාවේ
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

### උපලේඛනය

1. පළාත් පාලන අමාත්‍යාංශයේ නම - බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය
2. පළාත් පාලන ආයතනයේ නම - පානදුර ප්‍රාදේශීය සභාව
3. දිස්ත්‍රික්කය - කලුතර
4. යොදා ඇති නම - ජයතිලක පාර
5. මාර්ග විස්තරය - පානදුර ප්‍රාදේශීය සභාවේ, වාද්දුව උප කාර්යාල බල ප්‍රදේශයේ අංක 702/ඒ, පට්ටියඑළිය නැමති ග්‍රාම සේවා වසමේ මොරොන්තුඩුව පාරෙන් ආරම්භ වී රතනසාර මාවත පාරෙන් අවසන් වන මීටර 600ක දිග ප්‍රමාණයෙන් යුත් මීටර් 3.66 දක්වා පළලින් යුත් පාර.

05-245

---

## මාතර මහා නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම පහත සඳහන් පරිදි වේ.

මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නෙළුම් ඒ. ගමගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2024 මැයි මස 08 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | පාරේ නම | පාරේ ආරම්භය | පාරේ අවසානය | ශ්‍රේණිය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | තාර | | කොන්ක්‍රීට් | | කුට්ටිගල් | | බොරළු | |
| | | | | දිග | පළල | දිග | පළල | දිග | පළල | දිග | පළල |
| 1. | හිත්තැටිය මැද ශ්‍රී රතනපාල නාහිමි මාවත පළමු හරස් මාර්ගය | ශ්‍රී රතනපාල නාහිමි මාවත | නිවස | | | | | | | 86m | 4.57m |
| 2. | කුමාරදාස මාවත | අකුරැස්ස පාර (ශ්‍රී රතනපාල නාහිමි මාවත) | ඇලවෙල්ල පාර පාළම අසල පෙර පාසල ඉදිරිපිට | | | | | | | 585m | 6m |

05-278

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.